සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

දිරිය මව හා සත්තු වත්ත

මැයේ සන්නසේ සුබස් සිතිවිල්ලේ "දිරිය මව හා ඇගේ දරුවන්" ගැන ලිවීමෙන් මා අදහස් කලේ සියබසට ඇතුලු වී ඇති "විස බීජයක්" ඔබේ අවධානයට යොමු කිරීමයි.

ලේකකයකුගේ ප්‍රමාදයක් නිසා හෝ නොදන්නාකම නිසා න ල ශ/ණ ළ ෂ මාරු වී ඇති තැනක් දුටු විටත් අල්ප ප්‍රාන/ මහා ප්‍රාන අකුරක් මාරු වී ඇති තැනක් දුටු වියත් ඒ ගැන ලියන ඇත්තන් මෙබඳු වැරදි දැක දැක මුනි වන රකින්නේ ඇයි ද යන්න කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීම අනෙක් කාරනයයි.

පැදි ලියන්නන් අතින් සිදුවන මෙබඳු වැරදිවලට සමාව දිය යුතු යයි කියති.

"ගොඩින් නැව දියෙන් රතය ද නොයනු ඇත" යන කවි පදයේ ඇති "රතය" හරි නැත. එක්කෝ සකු බසේ "රථය" එ සෙයින් ම ලිවිය යුතුය. නො එසේ නම් "රිය" යන වචනය ලිවිය යුතුය. එලිවැට රැකීම සඳහා හෝ විරිත රැකීම සඳහා ඒ දෙපදය නොගැලපෙතැයි සිතූ කවියා "රතය" යන පදය තෝරා ගෙන ඇත.

කිවි බස සාමාන්‍ය වියහරට ගැනීම අපහසු ය. (අසා/අශ්වයා) අස්සයා, (පොලව/පෘථිවිය) ප්‍රරුතුවිය, (කුරිරු/ක්‍රූරිරු = කෘර) ක්‍රරුර/කුරුවිර වැනි වචන ගැන සිතා එය තේරුම් ගත හැකිය.

අපට කිසි දාක නිවැරදිව කිව නොහැකි න ල ශ/ණ ළ ෂ න ක් අපි තාමත් රැක ගෙන සිටිමු. කලාතුරකින් කියවෙන මහා ප්‍රාන අකුරු රැකගෙන සිටිමු. කිසි ම කෙනකුට කිසි ම දවසක අවශ්‍ය නොවන (ඉලු/ඉලු) ල් /ල්ල් (ලෝ) ස්වරය රැකගෙන සිටිමු.

මින් වසර හැටකට හෝ හැට පහකට පමන පෙර ලංකාදීප පත්‍රයේ ලමා තීරයෙන් ප්‍රසූත කරන ලද "සත්තු වත්ත" අද සිට බසේ මුල් බැස ගෙන හමාරය. රූපවාහිනිය ශබ්දවාහිනිය (රේඩියෝව) පුවත් පත් එකමුතු වී (සත්ව + උද්‍යානය = සත් + උයන) සත්තුයන යන නිවැරදි වචනය රටට හඳුන්වා දිය හැකිය. HUMAN ZOO නැමැති පොත "මනු සත් උයන" යනුවෙන් නිවැරදි ව සිංහලට පෙරලා ඇත.

වතු/වත්ත යන්නෙහි ඇත්තේ වවා - ජූ බිම්කඩ (ඉඩම) යන තේරුමයි. පාලු - මුඩු බිම් වතු ලෙස හඳුන්වන සිරිතක් නැත. පොල්/තේ/රබර්/කුරුඳු වතු ගැන ඔබ අසා ඇත. වැළිවත්තක් ගැන මතකයක් මට ඇත. එහි තේරුම විය යුතුය. පසුව එය ගමට ද වියහර වන්නට ඇත. වැළිවත්ත යන ගමේ නියම අර්ථය "වැළිගම" යන්නයි.

"ZOO" යනු ZOOLOGICAL යන පදය කෙටි කොට හඳා ගත් එකකි. එය ග්‍රීක් බසින් ඉංගිරිසියට ඇද ගෙන ඇත. අපේ බසේ ඌ - ගු - දු - පු - මු - රු - ලු - හු යන නාම ප්‍රකෘති කිය-වෙන්නේත් ZOO යන වචනය විදියටමය.

"රූ" රුව - රුවට - රුවින් - රුවක් ආදි වශයෙනි වරනෙගෙන්නේ. "දූ" දුව - දුවට - යනුවෙන් මෙන් ම දුව - දුවට - දුවක් යනුවෙන් වෙනත් තේරුමක් දීම සඳහා දෙවිදියකට වර හැඟේ. අනෙක් පදවල මුලකුර දිගු "ලා" ස්වර ශබ්දය ඇතිව කිය වේ. ලා - ලාට - උගේ - උගෙන් යනුවෙන් උ - ලා ස්වර දෙකම යෙදී ඇත.

පූ යනු කැවිම් ය. මූ යනු මූ යනු මූත්‍රා ය. ලූ පොල් යනු (ලූ පොල් = ලොකු පොල්, හොටෑ (හො + අදහ) පොල් = උළු වි ඇති කුඩා පොල්) ලොකු පොල් ය.

ඉංගිරිසියෙන් ගත් "ගැසට් සහ විසා" වැනි අප බාවිතා කරන්නේ අපේ බසේ වියරන නියර ගැන කිසිදු තැකීමක් නැතිව ය. අපි "ගැසට් එකක්" ගැන කතා කරනු මිස "ගැසටයක්" ගැන කතා නොකරමු. විසාව - විසාවක් වැනි වියහරක් ද අපට නැත.

අද ඉංගිරිසි බසේ නාම පදයකට "එක" යන පදය එකතු කොට ඒක වචන නාම පදය හදා ගන්නා සිරිතක් අප අතර ඇත. ඊට හේතුව ඒ වචනවලට සිංහල මූනතක් නොදැමීමය. ඉංගිරිසි බොටල් කෙටල් සිංහලට බෝතල් - බෝතලය, කේතල් - කේතලය වී බාවිතා වන්නේ ඒ වචනවලට සිංහල මූනතක් දැමීම නිසාය. පාක් එක බීච් එක කා එක (කාරෙක) වැනි වචන අද බෙහෙවින් බාවිතා වේ.

"ගුරු" යන්න ඉන්දියානු බාසාවලත් සිංහල බාසාවේත් දක්නට ලැබෙන පදයකි. එය දැන් ඉංගිරිසි බාසාවේ ගුරු - ගුරුස් යනුවෙන් බාවිතා වේ. බාසා - බසාස්, බාබ3 - බාබෘස් යන වචන ගැන ද හිතන්න.

"සූ" යන්න සිංහල බාසා නියරට අනුව "සුව" හෝ "සුහුය" කර ගත හැකි උවත් ඒ ගැන සිතන්නට අපේ උගතුන් පසු බාන බව පෙනේ. එවිට නූගතුන් ගේ වියහර තහවුරු වේ; මුල් බැස ගනී.

විසි එක් වැනි සියවසට ගැලපෙන සේ අපේ හෝඩිය සකස් කිරීම ගැනත් අලුත් වචන සියබසට එකතු කිරීම ගැනත් උගතුන්ගේ අවධානය යොමු විය යුතුය. ඒ සඳහා රජය මූලික විය යුතුය.

සමහරු බොරලු පාරේ කරත්ත යෙන් යති. තවත් සමහරු " කාපට්" පාරේ කාරයෙන් යති.

සුභාෂිතයෙන්.....

වි ක ධර්මබන්ධු

සුදන ගුනෙන් යුතු උතුමන්ගෙ
අඹිමත'තින් තිර සිත නොකල හැකි
සිසිල ගුනෙන් යුතු දිය දහර
මිටි මගකින් යන කල නවතති

පියකරු
දුරු
පිවිතුරු
කවිරු

ගැඳි පැදිය:

සුදන ගුනෙන් යුතු
පියකරු උතුමන් ගේ
අඹිමත'තින් තිර සිත
දුරු නොකල හැකි (ය)
සිසිල ගුනෙන් යුතු
පිවිතුරු දිය දහර
මිටි මගකින් යන (ගලායන) කල
කවිරු නවතති.

සත්පුරුස ගුනය ඇති පින්පාට (පියකරු) උත්තමයන්ගේ ස්තිර අදිස්ථානය (කාටවත්) වෙනස් කල නොහැකිය. (එය හරියට) සිසිල් දිය දහරාවක් පහත් තැනින් ගලා යන විට කිසිවකුට එය නැවැත්විය නොහැක්කාක් මෙනි.

සුදන ගුනෙන් යුතු උත්තමයන්ගේ ස්තිර අදිස්ථානය හොඳ එකක් විය හැකිය. මගේ අදහස නම් හැම විට ම එය එසේ නොවිය හැකි බවය.

පන්සලක් හැදීමට සිතා ගෙන සිටින උත්තමයකුගේ සිත පාසලක් හැදීම සඳහාත් පාසලක් හැදීමට සිතා ගෙන සිටින උත්තමයකුගේ සිත පන්සලක් හැදීම සඳහාත් වෙනස් කල හැකි අවස්ථා තිබිය හැකි ය.

කෙනෙකු නැසීමට තීරනය කරගෙන සිටින දුදනකුගේ සිත වෙනස් කල නොහැකි විය හැකිය.

(සුදන හෝ දුදන) එකිනෙකාට පෙම් බැඳි තරුනයකු ගේ හා/හෝ තරුනියකගේ සිත ද වෙනස් කල නොහැකි විය හැකි ය.

එහි දී සුදන කම හෝ දුදනකම බල පාන්නේ නැත.

පහලට ගලන දිය පාරක දිය ඉහලට ගෙන (යලිත් පහලට) ගලා යෑමට සලස්සන අවස්ථා ඇතත් වතුර ඉහලට ගලා යන්නේ නැත. බෑවීමක් නැති තැන වතුර එක් තැන රඳ පවතී. උස් තැනක ඇති ගලක් උවත් ඉහලට පෙරලෙන සිරිතක්/දහමක් නැත.

අහසින් ගිය ඉසිවරයකු (අඬ) නිරුවතින් දිය නාමින් සිටි අඟනක් දැක රිදී බලය නැති වී බිමට වැටී බව අසා ඇත්තෙමි. එදා ඉසිවරියන් සිටියා නම් නිරුවතින් දිය නාන පිරිමින් දුටුවා නම් ඔවින්ටත් මේ දෙයම වෙන්නට ඉඩ තිබිනි.

අඹිමත'තින් = අභිමත අර්ථයෙන් යන සකු වචන සිංහලට බිඳෙන්නේ අඹිමත් + අරුතින් = අඹිමත "රුතින් යනුවෙනි. " අර්ථයෙන්" යන්න "අතින්" යනුවෙන් බිඳිය නො හැකි ය. ඒඒ පට ය. කිවියන්ට ඒ අවසරය ඇතැයි කියති. "වෙල්යායක ගොන් දෙන්නෙක් කකා උනි" මේ ජන කවිය ගෙතූ කෙනා වියාකරනය නොතකා "ගොන් දෙන්නෙක්..... උනි" යනුවෙන් ලියා/කියා ඇත.

පිවිතුරු වතුර පමනක් නොව පල්වතුර කුනු වතුර ලෝ දිය උනත් ගලන්නේ පහලට ය.

ධර්ම හේවාමද්දුම

බෞද්ධ උරුමය වෙනුවෙන් කැපවූ අනගාරික ධර්මපාල තුමා

පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආධිපත්‍යය යටතේ ශත වර්ෂ ගණනාවක් අපේක්ෂා භංගත්වයෙන් හා ආත්ම විශ්වාසයෙන් තොරව ජීවත් වූ සිංහල ජාතියට නැවත තම උපත් බිමේ පමණක් නොව, ලොව අන් බලවත් ජාතීන් සමග ද, උරෙනුර ගැටී සිටීමට තරම් පොහොසත් වන්නට, ජීව වායුව පිම්බීමට සමත් වූ අනගාරික ධර්මපාලතුමා 1864.09.17 දින මෙලොව එළිය දුටුවේය.

මාතර හිත්තැරුවියේ දොන් කරෝලිස් හේවාවිතාරණ මැතිතුමන්ගේ හා මල්ලිකා හේවා විතාරණ මැතිණියගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය වශයෙන් මෙලොව එළිය දුටු ධර්මපාල ශිෂ්‍යයා මුලදී ඉංග්‍රීසි විදුලාලට ගොස් එහිදී අපරදිග භාෂා උගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලිපිකරු-වකු වශයෙන් රජයේ සේවයට ඇතුළු විය. පසුව, ඉන් අස්වී හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි ඇතුළු ශේෂ්ඨ පැවිදි පඬිවරුන්ගේ පා සෙවනේ වැඩි, බුදු දහමත්, පෙරදිග භාෂාවනුත් හදාරා ආගමික, ජාතික හා සාමාජික කටයුතුවල නිරත වන්නට විය.

රජයේ ලිපිකරුවකු වශයෙන් රැඳී සිට එකල ඉතා චමත්කාර ජනක වූ සිවිල් සේවාවට අවතීර්ණ වීමට ලෙහෙසියෙන්ම හැකි කම තිබියදී එවැනි දිවියක් ප්‍රතික්ෂේප කළ එතුමා තමාගේ ජීවිතය බැබළවීම වෙනුවට මුළු මහත් සිංහල ජාතියේම ඉදිරි ගමන තකා වෙනත් මගක් තෝරා ගෙන මහා ජාතික සටන් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අධිෂ්ඨාන කර ගත්තේය. එකසර කෙසරිඳු සේ කිසි විටක පසු නොබා මහත් ධෛර්යයෙන් යුතුව කටයුතු කරමින් සිංහල ජාතිය ගොඩ නැංවීමට එතුමන් කළ ලළ්ක පුද්ගල සංස්කෘතික විප්ලවයල (One man cultural revolution) මෑත ඉතිහාසයේ අනෙකුත් සියළුම ජාති හිතෙෂීන් විසින් කරන ලද සේවාවනට වඩා උත්කෘෂ්ඨ වන්නේ එතුමා පරිත්‍යාගශීලීත්වයෙන් හා අවංක චේතනාවෙන් එය සිදු කරන ලද බැවිනි.

ආරම්භයේදී හෙන්රි ඕල්කට්තුමා සමග පරම විඥනාර්ථ සමාගමේ හා ලසඳරැසල පුවත්පතේ කටයුතු කරමින්, මෙතුමා සිංහලයාගේ ආගමික හා සාමාජික අභිවෘද්ධිය තකා කටයුතු කරන්නට විය. පසුව 1891 දී, මෙතුමා ප්‍රථම වරට භාරතය බලා ගමන් කළේය. මෙහිදී එතුමාට ප්‍රත්‍යක්ෂ වූයේ, බුදුරජාණන් වහන්සේගේ පාද ස්පර්ෂයෙන් නිරතුරුව පවිත්‍ර වූ බුද්ධගයාව, කුසිනාරාව, සාරානාත්, ලුම්බිණි ආදි ස්ථානවල බෞද්ධ සුලුටක් හෝ නොමැති බවය. තවද, බුදුන් දවස කෝටි සංඛ්‍යාත බෞද්ධයන් විසූ ඉන්දියාවේ ජනතාවට මේ වන විට බුදුරදුන්ගේ ශ්‍රී නාමය පවා අමතකව ගොස් තිබිණි. එදා බුද්ධගයාවේ පැවැති මහන්තාගේ මිථ්‍යාදෘෂ්ඨික ක්‍රියා කලාපය හා භාරතයේ බුදු දහමට පැවැති තත්ත්වය ද, නිසා දැඩි කම්පාවට පත් ධර්මපාලතුමා නැවත බුද්ධාගම භාරතයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමට අධිෂ්ඨානය කර ගත්තේය. මේ අනුව 1891 දී බුද්ධගයා මහා බෝධි සමාගම පිහිටුවා ගත්තේය.

මේ අනුව වර්ෂ 40 ක් ගෙවන විට එතුමන් විසින් කරන ලද නොයෙක් ආගමික හා ශාසනික කටයුතු වලින් භාරත වැසියන්ට, තමාට නැතිව ගිය බුදු දහමේ දායාදය නැවත ලබා ගැනීමට හා එහි අගය අවබෝධ කර ගැනීමට හැකි විය. මෙය ක්‍රි.පූ. 3 වැනි ශත වර්ෂයේ මිහිඳු මා හිමියන් ලක් දිව බුදු සසුන පිහිටුවීමට වඩා අති ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් වන්නේ එතුමාට මිහිඳු හිමිට මෙන් ධර්මාශෝක හෝ දෙවැනි පෑතිස් වැනි රජවරුන්ගේ අනුග්‍රහයක් නොලැබූ බැවිනි. එතුමාට මේ කර්තව්‍යයන්හි නිරත වීමට සිදුවූයේ ඉන්දියාවේ හා ලංකාවේ සිටි නොයෙකුත් ඊර්ෂ්‍යාකාර කුහක සතුරන් විසින් ඇති කරන ලද බාධාවන් මධ්‍යයේය.

මෙතුමන් විසින් විදේශික ස්වකීය වාග් ප්‍රහාරයෙන් මෙල්ල කළ අවස්ථා එමටය. ඒ අතර භාරතයේදී දුම්රියක 1 වැනි මැදිරියක ගමන් කරමින් සිටියදී රඳල අහංකාර සුදු ජාතිකයකු තමා ඉදිරියේ සිට දුම්වැටියක් දල්වා මත්පෙන් බොන්නට වූ විට එය නවත්වන්නට කළ ඉල්ලීම නොතකා සිටි අවස්ථාවේදී දුම්රියෙන් ඉවතට විසි කොට සුදු ජාතිකයා හිඟඩ කළ අයුරුත්, ලංකාවේදී ආණ්ඩුකාරයා මුණ ගැසීමට දවල් 1.00 රජ මැදුරට ගිය විට 2.00 වන තෙක් ආණ්ඩුකාරයා නිදාගෙන සිට පමා වී ආ විට... ලනුඹලා වැනි, වේලාවට වැඩ නොකරන මෝඩයන් නිසා මගේ වටිනා කාලය අපතේ ගියා. මට නුඹ සමග කතාවක් ඕනෑ නැහැ...ල කියමින් ඔහුට බැණ වැදී පිට වී ගිය සිද්ධිය ද සිංහලයාට කිසි දිනක අමතක නොවේ.

බුද්ධගයාව බේරා ගැනීමේ කර්තව්‍යයේදී එතුමන් විසින් එහි නවත්වන ලද හික්ෂූන් වහන්සේලාට දාමරිකයන් විසින් පහර දෙන ලද අතර, මෙතුමාට ඒ සම්බන්ධයෙන් අධිකරණයට යැමට ද, ලෝක බෞද්ධයන්ගේ ඇස් ඇරවීම සඳහා විශාල මහජන මතයක් ඇති කිරීමට ද සිදු විය. ඉන්දියානු ජාතික සංගමයට පවා කරුණු දැක්වීමෙන් අනතුරුව බෞද්ධයින්ට එක්තරා දුරකට බුද්ධගයාවේ පාලනය ලැබිණි.

1893 දී ඇමරිකාවේ චිකාගෝ නුවර පවත්වනු ලැබූ ලෝක දෘෂ්ඨි නායකයන්ගේ සම්මේලනයට සහභාගි වී ලෝක ආගමික නායකයන් වන ස්වාමි විවේකානන්ද ආදීන් ඉදිරියේ සිත් ඇද ගන්නා ආකාරයේ දේශනයක් කළ මෙතුමා ඔවුන් කා අතරත් කැපී පෙනීමට සමත් විය. විශේෂයෙන්ම එහිදී වෙනත් ආගමි භක්තිකයකු සිය දේශනයේ ප්‍රතිඵලයක් වශයෙන් බුද්ධාගමට හරවා ගැනීම එතුමා ජනප්‍රිය වීමට හේතු විය. ආපසු එන ගමනේදී මේරි පෝස්ටර් මැතිණිය හොනොලුලුවලදී හඳුනාගෙන බෞද්ධාගමට විශාල අනුග්‍රහය ලබා ගැනීමට ද හැකි විය. 1896 දී ජපානයේ ආගමික උත්සවයකට සහභාගී වූ මෙතුමා බ්ලැවැට්ස්කි මැතිණිය හඳුනා ගෙන එමගින් ශාසනයට විශාල අනුග්‍රහයක් ලබා ගත්තේය. මහාබෝධි සමාගම මගින් මිෂනාරි අධ්‍යාපනය වෙනුවට බෞද්ධ පාසල් පිහිටුවීමත්, ලමහාබෝධිල හා ලසිංහල බෞද්ධයාල යන පුවත්පත් මගින්